# 15 දිරිමත් දිවියකට සවිය



ශු. ලූක් 7:11-17

සමකාලීන ජුදෙව් සමාජය තුළ දැඩි ලෙස පීඩනයට ලක් ව සිටි කාන්තාවන් කෙරෙහි ජේසුස් වහන්සේ විශේෂ ලෙස සැලකිලිමත් වූ සේක; ඔවුන් කෙරෙහි පුළුල් දැක්මකින් යුතු ව කටයුතු කළ සේක. විශේෂයෙන් ජුදෙව් සමාජය තුළ වැන්දඹු කාන්තාවන් ඉතාමත් අසරණ තත්වයකට පත් ව සිටියහ. මෙහි දී තම එක ම පුත්‍රයා ද අහිමි වූ වැන්දඹු කාන්තාවක කෙරෙහි ජේසුස් වහන්සේ කරුණාව දැක්වූ ආකාරය විමසා බලමු.

පවුලක මනා පැවැත්මට මව, පියා හා දරුවන් අතර පවත්නා යහපත් සබඳතාව බෙහෙවින් බලපානු ඇත. බලාපොරොත්තු නොවූ මොහොතක යම් හේතුවක් නිසා පවුලේ එක් සාමාජිකයකුගේ වියෝවීමක්, හෝ ගැටලුවක් සිදු වුව හොත් සමස්ත පවුලේ පැවැත්ම, සතුට කෙරෙහි එය බලපානු ඇත.

මෙලෙස විශේෂයෙන් පවුලක පියා අහිමි වුව හොත් පවුලේ අනෙක් අයගේ බලාපොරොත්තු රහිත වීම, එකිනෙකා තනි වීම, ආර්ථිකය බිඳ වැටීම මෙන් ම ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ ව ගැටලු මතු වේ. පවුලේ පියා අහිමි වීම නිසා තනි වන මව හා දරුවන්ගේ ජීවිත අපේක්ෂා බිඳ වැටී අසරණ භාවයට පත්විය හැකි ය. මෙවන් අවස්ථාවක වැන්දඹුවක් බවට පත්වන කාන්තාව ජුද සමාජයේ කොන් කරන ලද අවාසනාවන්ත - අසරණ කොටසක් බවට පත්වේ. මින් මතු වැන්දඹුවට ශක්තිය වන්නේ තම දරුවන් ය. එවන් මොහොතක ඇයට තම දරුවන් ද අහිමි වුව හොත් එවිට ඇය පත්වන අසරණ භාවය කෙබඳු විය හැකි ද?

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
ශු. ලූක් 7:11-17

නායින් නම් නුවර විසූ වැන්දඹුවක් තම එක ම පුතා මරණයට පත් ව බොහෝ සේ කම්පාවට හා කම්පනයට පත් ව සිටි අවස්ථාවේ ජේසුස් වහන්සේ ඇයට සහනය සලසා දුන් ආකාරය ඉහත බයිබල් පාඨයෙන් දක්වේ.

ජේසුස් වහන්සේ වැන්දඹු කාන්තාව දැක, මව කෙරෙහි අනුකම්පා කොට "හැඬීම නවත්වන්නැයි" වදාළ සේක. දෙණට අත තබා "යෞවනය නැගිටින්නැයි මම ඔබට කියමි"යි වදාළ සේක. උන්වහන්සේ මරණින් නැගිටුවනු ලැබූ පුත්‍රයා සිය මෑණියන්ට භාර දුන් සේක. ජේසුස් වහන්සේ සිදුකළ මෙම හාස්කම පීඩනයට පත් වූ වැන්දඹු කාන්තාවකගේ වේදනාවට ජේසුස් වහන්සේගෙන් ලද සහනදායී ප්‍රතිචාරයකි.



15.1 රූපය - මරණින් නැගිටුවනු ලැබූ පුත්‍රයා නැවත සිය මෑණියන්ට භාර දීම

මෙයින් පසක් වන්නේ;






නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ජේසුස් වහන්සේ ජුදා කාන්තාවන් මුහුණ දුන් අභියෝග හමුවේ ඔවුන්ට සහනයක් වූ බව

දුක් පීඩා මැද ළතැවුලෙන් සිටි වැන්දඹුවට ජේසුස් වහන්සේ සැනසීම ගෙන දුන් සේක. ජේසුස් වහන්සේ ඇයගේ වේදනාවට අනුගත වූ සේක. සහනය සැලසීමට ක්‍රියා කළ සේක. මෙලෙස ජේසුස් වහන්සේ බොහෝ අවස්ථාවල කාන්තාවට නිසි තැන ලබා දෙමින් ඇය සමාජයේ පිළිගැනිමට ලක් කළ සේක. පෙර පාඩමින් ද අවධාරණය කළ පරිදි පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමේ දී ඇය කෙරෙහි අනුකම්පා කොට ඇය මුහුණ දුන් අභියෝගය ඉදිරියේ ඇයට සහනය සැලසූයේ සමාජයට ද අභියෝගයක් එල්ල කරමිනි.

## ජේසුස් වහන්සේ වැන්දඹුව කෙරෙහි අනුකම්පා කොට ඇගේ වේදනාවට අනුගත වූ බව

හුදෙකලා වී, බලාපොරොත්තු සුන් වී ගැටලු හමුවේ අසරණ ව සිටි වැන්දඹුව කෙරෙහි ජේසුස් වහන්සේ අනුකම්පා කළ සේක. මෙහිදී වැන්දඹු කාන්තාවකගේ අසරණ භාවය මෙන් ම, මවකගේ හැඟීම් හා වේදනාව උන්වහන්සේ තේරුම් ගත් සේක. මව කෙරෙහි කරුණාවන්ත හදවතකින් ක්‍රියා කළ සේක. ඇයගේ දිවියට නව බලාපොරොත්තුවක් දෙමින් තම පුත්‍රයාට නැවත ජීවිතය ලබා දුන් සේක. එමගින් ඇයගේ අසරණ වූ තනි වූ ජීවිතය නැවත ගොඩ නැගීමට ශක්තියක් වූ සේක. ඇයගේ මියගිය බලාපොරොත්තුවලට නව ජීවයක් ලබා දුන් සේක.

**මෙනෙහි කරමු**

*ජීවිත ගැටලු හමුවේ අපි සමහර අවස්ථාවල දී ස්වාමීන් වහන්සේ අතහැර විවිධ වූ මිථ්‍යා විශ්වාස මත සහනය සොයා යන්නෙමු. එහෙත් අපගේ සුන් වූ, මිලාන වූ බලාපොරොත්තුවලට සහනය සලසා දිය හැකි වන්නේ ස්වාමීන් වහන්සේට පමණි. උන්වහන්සේ අප හදවත් ජීවත් කරවන පිණිස අපගේ අවශ්‍යතා ඉදිරියේ අපට පිහිටවන සේක. අද පවා..........*




## ක්‍රියාකාරකම

1. ශුද්ධ බයිබලය තුළ දේව කරුණාව ලද තවත් කාන්තාවන් දෙදෙනෙකු නම් කර ඒ චරිත ඇසුරින් ලද හැකි ආදර්ශ පෙන්වා දෙන්න.
2. ජේසුස් වහන්සේ ආදර්ශයට ගනිමින් විශේෂයෙන් අසරණ - හුදකලා වූ කාන්තාවන් සවිමත් කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.